
# 12. පිළිවෙළකට වැඩ කරමු

ළමයිනි, කෙනකු නිවසක් හදන්නට සූදානම් වන්නේ යැයි සිතන්න. ඔහු පළමුවෙන් ම අවශ්‍ය දෑ රැස් කරයි. ඉන් පසු අත්තිවාරම දමයි. බිත්ති ගොඩනගයි. බිත්තිවල උළුවහු සහ ජනෙල් සවි කරයි. පසු ව වහළය සාදයි. දැන් නිවසක් සෑදී අවසානයි.

එම නිවස සැණෙකින් සෑදුණා ද? නැත. එය ක්‍රමක්‍රමයෙන් ගොඩ නැඟුණි.



මේ ක්‍රමයට මිනිසා සෑම වැඩක් ම පියවරෙන් පියවරට පිළිවෙළකට කිරීම අල්ලාහ් බලාපොරොත්තු වේ.

සලාත් ගැන ද සිතන්න. කෙනකු සලාතය ඉටු කිරීමට පළමු ව තම ශරීරය පිරිසිදු කර ගනියි. ඇඳුම් සහ සලාත් කරන ස්ථානයත් පිරිසිදු කර ගනියි. වුලූ කරයි. පසුව කිබ්ලාව පෙරටු කර ගනියි. ඉන් පසු සලාතය ආරම්භ කරයි. අනුපිළිවෙළට සලාතය ඉටු කරයි.

මුස්ලිම්වරුන්ට සෑම කාර්යයක් ම පිළිවෙළකට කිරීම සඳහා අල්ලාහ් සලාතය මගින් පුහුණුවක් ලබා දෙයි. අපි ද පිළිවෙළකට අපගේ කටයුතු ඉටු කිරීමට පුරුදු වෙමු.

## පැවරුම්

අප වැඩක් කරන විට සැලකිල්ලට ගත යුතු කරුණු පහක් ලියන්න.